# කුලසිංහයන් ගේ සොයාගැනීම් හා නිර්මාණ කීපයක්

## කුලසිංහ පෙරසවි කොන්ක්‍රීට්

කුලසිංහ පෙරසවි කොන්ක්‍රීට් තාක්ෂණය යනු කුලසිංහයන් - කොන්ක්‍රීට් කුලසිංහ බවට පත් කළ ඔහුගේ සුවිශාල සොයාගැනීම ලෙස හැඳින්වීම අවිවාදිත ය. සාමාන්‍යයෙන් නිවසක් තැනීමට වැයවන මුදලින් අඩක් වැය කර නිවසක් තැනිය හැකි වීම සහ ශ්‍රමය අඩු වීම මෙහි ඇති වාසි ලෙස දැක්විය හැකි ය.

පෙරසවි කොන්ක්‍රීට් ක්‍රමයේ දී වැලි භාවිතයක් නැත. එබැවින් ගංගාවලින් වැලි ගොඩ දැමීම නිසා ඇතිවන අතුරු විපාක ප්‍රශ්නයට ද මෙය විසඳුමකි. මෙහි දී යොදා ගන්නේ සිමෙන්ති, ගල්කුඩු හා කොහු කුඩු ය.

සිමෙන්තිවල, රසායනික ක්‍රියාවලියට ලක්නොවූ හුණු ඇත. එබැවින් සිමෙන්තිවලට ජලය යෙදූ විට හුණු ඇති වේ. මේ තත්ත්වය බඳමයට අහිතකරය. මෙහි දී ගල්කුඩු යෙදූ විට ඒවායේ වූ සිහින් සිල්කාමය කොටස් හුණු සමඟ ප්‍රතික්‍රියා කොට කැල්සියම් සිලිකේට් නම් වූ රසායනික සංයෝගය සාදයි. මෙය බඳමයේ සවි ශක්තිය වැඩි කිරීමට හේතු වේ. මෙය සෙමින් සිදුවන ක්‍රියාවලියක් නිසා කල්යත්ම බඳමයේ ශක්තිය වැඩි වීම සිදු වේ. මේ ක්‍රමයට බිත්ති සෑදූ විට, විදුලිය සඳහා බට දැමීමට බිත්ති කැඩීම අවශ්‍ය නොවේ.ඒවා ඉතාමත් පහසුවෙන් කෙලින් කැපිය හැකි තාක්ෂණයක් ද ඔවුන් සතුය. තට්ටු නිවාස සෑදීමේ දී ෂටරිමක් නොමැතිව තට්ටුව යෙදීමේ පෙරසවි තාක්ෂණය ද වඩාත් ලාබදයක මෙන් ම කඩිනම් ය.පෙරසවි තාක්ෂණය යොදා, ඉතාම මෑතක දී වර්ග අඩි 40, 000 ක ගබඩා සංකීර්ණයක් නිමවීමේ කටයුතු කුලසිංහයන් ගේ අධීක්ෂණය යටතේ සිදුවිය. සාමාන්‍ය ක්‍රමයට ඒ සඳහා ඇස්තමේන්තුව, වර්ග අඩියට රු.800 ක් පමණ වූ නමුත් වර්ග අඩිය රු. 350 ක වියදමෙන් ඔහුගේ තාක්ෂණය යොදා එම කටයුත්ත නිම කිරීමට හැකි විය.



පෙරසවි කොන්ක්‍රීට් ක්‍රමයට නිමැවිය හැකි නිවාස ආකෘති



කුලසිංහයන් ගේ වැඩ බිමෙහි වූ දර ගෑස් නිෂ්පාදකයක් මගින් ක්‍රියාත්මකවන ජෙනරේටරය

## තේ වියළන යන්ත්‍රය

තේ වියළීමේ තාක්ෂණය කුලසිංහයන් විසින් වසර ගණනකට පෙර සොයාගත් නමුත් එය වාණිජ මට්ටමින් ඉදිරිපත් කළ නොහැකි විය. එතෙක් එම යන්ත්‍රයේ වූ අඩුපාඩු නිවැරදි කර දියුණු කළ යන්ත්‍රය, ඔහු විසින් දැන් ඉදිරිපත් කර තිබේ. අද තේ කිලෝ ග්‍රෑමයක් වියැළීමට වැයවන දර කිලෝ.ග්‍රෑ.1 1 / 2 ක ප්‍රමාණය, කි.ග්‍රෑ.1/2 දක්වා අඩු කර ගැනීමට ක්‍රමයක් පර්යේෂණ මගින් ඔහු සොයාගත් අතර දර කිලෝ 100 ක භාවිතය දර කිලෝ 25 දක්වා අඩුකර ගත හැකි ආකාරයට අද එම තාක්ෂණය වැඩි දියුණු කර ඇත.

මෙහි දී සිදුවන්නේ දර කුඩා කැබලිවලට කපා ගෑස් නිෂ්පාදක යන්ත්‍රයකට (Gas Producer ) දමා සෑදෙන ගෑස් මගින් තේ වියළන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම ය. මේ තාක්ෂණය වාහන ධාවනය සඳහා යොදා ගැනීමට ද පුළුවන. මෙහිදී ගෑස් නිෂ්පාදක යන්ත්‍රය තුළ ම ගෑස් පෙරීම, සිසිල් කිරීම වැනි කටයුතු සඳහා අවශ්‍ය කොටස් සවිකර ඇත.විදුලි ජනක යන්ත්‍රයක් ( ජෙනරේටර් ) ක්‍රියා කරවීමට ද මේ ක්‍රමය යොදා ගත හැකි ය.




ජීව වායු ජනකයෙන් සෑදෙන ගෑස්, එක් රැස්වන බැරල
(කුලසිංහයන් ගේ නිවසේ ගෑස් අවශ්‍යතාව
සපුරා ගන්නේ මේ මඟිනි)

කුඹුරෙන් එන පිදුරු පොහොර බවට හැරවීමේ තාක්ෂණය 1991 වසරේදී කුලසිංහයන් විසින් හඳුන්වා දෙනු ලැබීය. මෙය රසායනික පොහොර නොයොද පොහොර ප්‍රශ්නය විසඳ ගන්නා අතර ම අමතර වාසි ගෙන දෙන ක්‍රමයකි.

ලංකාවේ වී වගාව කන්න දෙකකට සිදු-වන නිසා එක් කන්නයකින් ලබාගන්නා පොහොර අනෙක් කන්නය සඳහා යොද ගත හැකිය. කන්න දෙක අතර වූ සය මසක පමණ කාලය පුරා නිවසේ පරිභෝ-ජනයට අවශ්‍ය ගෑස් ලබාගත හැකි වීම මෙහි අතිරේක වාසියකි.

මෙම තාක්ෂණයේ දී , පිදුරු කුඩා කැබලිවලට කපා 10% ගොම මිශ්‍රිත ජලයේ පොගවා, ජීව වායු ජනකය තුළට දමා සීල් තැබීම සිදු වේ. මෙහිදී ගොම යොද ගන්නේ, පිදුරු දිරවීමට අවශ්‍ය නිර්වායු බැක්ටීරියා සැපයීම සඳහා යි. මෙසේ මිශ්‍රණය යෙදූ දිනට පසු ද සිට ම ගෑස් නිපදවීම ඇරඹු-ණත්, ඒවා දැල්වීම සිදු වන්නේ දින 10 කට පමණ පසුවය. මුලින් ලැබෙන ගෑස්වල කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි වීම ඊට හේතු වේ.

මුලින් ම සෑදූ ජීව වායු ජනකයේ, යම් යම් අඩුපාඩු පැවතිණි. එනම් ටික කලකින් නෙනමනය යට බැසීම නිසා ලැබෙන ගෑස් ප්‍රමාණය අඩුවීම වැනි ගැටලු ය. අද, ඒ ප්‍රශ්න විසඳ වැඩි දියුණු කළ ක්‍රමය යටතේ, ලබාගත හැකි ගෑස් ප්‍රමාණය ද දෙගුණයක් වී ඇත. (ටොන් 1 ක ජීව වායු ජනකයකින් ,පෙර ලබාගත් ගෑස් ප්‍රමාණය කියුබික් මීටර් 1 ක් වූ අතර අද ලබාගන්නා ප්‍රමා-ණය කියුබික් මීටර් 2 කි )

රාජ්‍ය නොවන ආයතනයක අනුග්‍රහය ඇතිව, මේ ක්‍රමය ඉතාමත් ඉක්මනින් ප්‍රථ-මයෙන් පොළොන්නරුව ප්‍රදේශයේ ගොවීන් වෙත හඳුන්වා දීමට කුලසිංහයන් විසින් සැලසුම් සකස් කර තිබේ. මෙවැනි ජීව වායු ජනක පෙර මිල කළ ප්‍රමාණයට වඩා අඩු මුදලකට එනම් ටොන් බාගය රු.15,000 හා ටොන් එක රු.20, 000 වැනි මිලකට නියම කර ඇත. මේවා, ගොවීන් අතර ජනප්‍රිය වූ පසු එම ප්‍රදේශය තුළ සිටින හැකියාව ඇති පුද්ගලයන් තෝරා ගෙන ජීව වායු ජනක නිපදවීමේ කටයුත්ත එහි ම ඇරඹීම තුළින් මේ ක්‍රමය ප්‍රචලිත කිරීම ඔහුගේ අරමුණ වේ.